# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.09.26 පැය 1925 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1800/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |

**විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවි, සජීවි පතරොම් ඇතුළු දේපළ සොයා ගැනීම - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**



රැඳවුම් නියෝග මත රඳවා සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගෙන් සිදු කරන ලද ප්‍රශ්ණ කිරීම් වලදී අනාවරණය වූ තොරතුරු මත බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2025.09.26 වන අද දින උදෑසන කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ පෑලියගොඩ මත්ස්‍ය වෙළඳසැලට යන මාර්ගය අසල බස් නැවතුම්පල පිටුපස ප්‍රදේශයේ තිබී පහත දේපළ සොයා ගෙන ඇත.

- **විදෙස් රටක නිෂ්පාදිත මයික්‍රෝ ගිනි අවි 01 ක් සහ එම පතරොම් ගැබ් 01**
- **විදෙස් රටක නිෂ්පාදිත රිවොල්වර ගිනි අවි 01**
- **ටී-56 පතරොම් ගැබ් 03**
- **ටී-56 සජීව පතරොම් 520**
- **අත් විලංගු ජෝඩු 01**
- **යුධ හමුදා ඇඳුම් කට්ටල 01**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**